නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය

(සංවාක්‍ය තර්කය)

(01) පහත දැක්වෙන තර්ක සප්‍රමාණ සංවාක්‍යද නිශ්ප්‍රමාණ සංවාක්‍ය ද යන්න නිගමය කරන්න. තර්කය නිශ්ප්‍රමාණවන විට බිඳී ඇති රීතිය හෝ රීතීන් සඳහන් කරමින් සිදු වී ඇති ආභාසය/ආභාස නම් කරන්න.

i. සියලු ළමයින්වත් ගුරුවරුන්වත් කඩිසර නැති හෙයින් කිසිම ගුරුවරයෙක් ළමයෙකු නොවේ.

ii. සිරිපාල බුද්ධිමත් නොවන්නේ හැම බුද්ධිමතෙක්ම ධනවත් වන නමුත් සිරිපාල ධනවත් නොවන බැවින්.

iii. සියලු රියදුරන් නීති ගරුක රියදුරන් නොවන අතර ඇතැම් රියදුරන් විනය ගරුක රියදුරන් නොවේ. එහෙයින් විනය ගරුක රියදුරන් නිතී ගරුක රියදුරන් නොවේ.

iv. සමහර සිවුපාවුන් ක්ෂීරපායී වන හෙයින් හා කිසිම උරගයෙකු සිවුපාවෙකු නොවන හෙයින් සමහර ක්ෂීරපායින් උරගුන්ය.

v. නව බදු කර්මාන්තවලට හානි වන අතර නව බදු සාමාන්‍ය ජනතාවට හොඳය. එම නිසා කර්මන්ත වලට හානිවන සියලු දේ සාමන්‍ය ජනතතාවට හොඳය.

(2) විශේෂ සාධ්‍ය අවයවයකින් හා ප්‍රතිශේධනාත්මක පක්ෂ අවයවයකින් සප්‍රමාණ නිගමනයක් ලබාගත නොහැක්කේ මන්දැයි සංවාක්‍ය පිළිබඳ ප්‍රධාන රීතින් ඇසුරින් පැහැදිලි කරන්න.

(3) සංවාක්‍ය පිළිබඳ ප්‍රධාන ප්‍රකාර සතරෙන් තුන්වෙනි ප්‍රකාරය දක්වා එහි සප්‍රමාණ උප ප්‍රකාර නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(4) සංවාක්‍යමය තර්කයන්හි දී සිදුවිය හැකි පහත දැක්වෙන ආභාසයන් නිදසුන් බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

i. චතුෂ්පද ආභාසය

ii. අව්‍යප්ත මධ්‍ය පද ආභාසය

iii. අයථා පක්ෂ පද ආභාසය

iv. අයථා සාධ්‍ය පද ආභාසය

(5) පහත සඳහන් ඒවායින් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් හඳුන්වා දී ඒ එකකට එක් උදාහරණ බැගින් දෙන්න.

i. ශුද්ධ සෝපාධික සංවාක්‍යයක්

ii. මිශ්‍ර සෝපාධික සංවාක්‍යයක්.

iii. මිශ්‍ර වියෝජක සංවාක්‍යයක්